**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

# <u>ලංසු ආරාධනය</u>

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත කාර්යාල බෑග 51ක් සැපයීම හා බාරදීම සඳහා වන ප්‍රසම්පාදනය**
**IFB අංකය : DIE/PRO/04/2024/71**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත කාර්යාල බෑග 51ක් සැපයීම හා බාරදීම සඳහා වන ප්‍රසම්පාදනය** සඳහා යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

1. මෙම ලංසුකරණය ජාතික තරඟකාරි ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.
2. සියළුම භාණ්ඩ පිරිනැමුම් ලිපියේ දින සිට සති 3 ක් ඇතුලතදී බාරදිය යුතුය.
3. රුපියල් තුන් දහස් පන්සීයක (රු.3,500/-) ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ, "සුහුරුපාය", 05 වන මහලේ, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ, ප්‍රසම්පාදන අංශයේ, නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙත ඉදිරිපත් කිරීමෙන් මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් **2025.09.15 දින සිට 2025.09.30 දින දක්වා කාල පරිච්ඡේදය** තුළදී මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය තුළ දී 0112 – 101559 දරන දුරකතන අංකය අමතා ලබා ගත හැක. 3 වැනි ඡේදයේ සඳහන් ව ඇති ලිපිනයට පැමිණ හෝ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන **www.immigration.gov.lk** හරහා හෝ නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව **2025.09. 15 දින සිට 2025.09.30 දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.3.00** තෙක් සිදු කළ හැක.

5. "මුල් පිටපත" (Original) හා "අනුපිටපත" (Duplicate) ලෙස නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු, වෙන වෙනමම කවරවල බහා එම කවර එකම කවරයක බහා මුද්‍රා තබා මෙම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්කරුගේ නම සහ IFB අංකය සඳහන් කර පහත සඳහන් කර ඇති ලිපිනයට 2025.09.30 වැනි දින ප.ව. 2.00ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් ඒ සඳහා 3 වැනි ඡේදයේ සඳහන් ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතුය. ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින හතලිස් නවයක් (49) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දිගු කරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගුභාවයෙන් යුක්ත විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම පැමිණීම සඳහා කැමැත්ත දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේදී 3 වැනි ඡේදයේ සඳහන් ලිපිනයේ දීම ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති,**
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
05 වැනි මහල,
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,